අපගේ සමායතන සමාජ වගකීම් ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් ම ඉලක්ක කරන්නේ අපගේ හවුල්කරුවන් සමග ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගැනීම හා ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන ප්‍රමිතිය වැඩිදියුණු කිරීම කෙරෙහි ය. අපගේ බෙදාහරින්නෝ හා අලෙවිකරුවෝ සැලකිය යුතු පිරිසක් වෙනස් හැකියාවන් ඇති පුද්ගලයෝ හා නැගී එන මධ්‍යම පංතියට පහළ සමාජයේ බිම් මට්ටමේ පුද්ගලයෝ වෙති. ඔවුන්ගේ ජීවිත නගා සිටුවීමේ අරමුණින් 2013 වසරේදී අපි මුලපිරුම් ගණනාවක් ආරම්භ කළෙමු. දිස්ත්‍රික් 12ක දහස් ගණනක් ව්‍යාපාරික හවුල්කරුවන්ට බයිසිකල්, ට්‍රයිසිකල් හා ඇස් කණ්ණාඩි පිරිනමන ලදී. අලෙවිකරුවන්ගේ දරුවන්ට රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීම සඳහා ශිෂ්‍යත්ව 55ක් පිරිනමන ලදී. අපගේ ප්‍රජා සංවර්ධන වැඩසටහන් පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් සමායතන සමාජ වගකීම පිළිබඳ පරිච්ඡේදයේ සඳහන් වේ.

රට පුරා අධ්‍යාපනය, ප්‍රජා හා සේවක සංවර්ධනය ඉලක්ක කර ගත් විවිධාකාර සමාජ වගකීම් ව්‍යාපෘති රැසකට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහාය දෙයි. දිනුම් තෑගි, සමූහ ප්‍රදාන, ජනාධිපති අරමුදලට දෙන දායකත්වය, ස්වදේශික ලාභ නො ලබන සංවිධානවලට දෙන සහයෝගය හා ආගමික උත්සව ආදියට දක්වන සහයෝගය ඔස්සේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජයට ප්‍රතිලාභ ලබා දෙයි.

## ආර්ථික වගකීම

ලෝක ලොතරැයි සංවිධානයට අනුව, 2013දී සම්පූර්ණ වසර තුළ ලොව පුරා ලොතරැයි අලෙවිය 4.9%කින් වර්ධනය විය. එය 2012 වසරේදී සිදු වූ 7.7%ක වර්ධනයට සාපේක්ෂව මධ්‍යස්ථ වර්ධනයකි. මෙම වර්ධනයට වැඩිපුර දායකත්වය සැපයුවේ ආසියා ශාන්තිකර හා ලතින් ඇමරිකා කලාපයයි. මෙම කලාප දෙකේ ම ලොතරැයි අලෙවිය පසුගිය කාර්තු තුන තුළදී ඉලක්කම් දෙකේ අගයකින් වර්ධනය විය. එහෙත්, 2013දී යුරෝපයේ සිදු වූ ලොතරැයි අලෙවියේ අඩු වීම හේතුවෙන් ඉහත කලාපවල වර්ධනය සමබර විය. අප්‍රිකානු වෙළඳපොළ වර්ධනය 2012 වර්ෂයට සාපේක්ෂව නො වෙනස්ව පැවතිණි. 2013 වසරේ ලෝක වෙළඳපොළේ ආතතිය, යුක්රේනයේ අර්බුදය හා ආර්ජන්ටිනාවේ ආර්ථික අස්ථාවරත්වය වැනි හේතු නිසා 2014දී ලෝක ලොතරැයි අලෙවි අපේක්ෂා පිළිබඳ පරිස්සම් සහගත විය යුතු ය. 2010-2013 වකවානුව තුළ 2011දී උපරිම වර්ධනයක් අත් පත් කර ගත් ලෝක ලොතරැයි අලෙවි වර්ධනයේ වේගය සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඩු වී තිබේ.

මෙම වසර තුළ ආසියා ශාන්තිකර කලාපය ද කැපී පෙනෙන ලක්ෂණ පෙන්නුම් කළේ ය. ආසියා පැසිෆික් කලාපයේ ලොතරැයි අලෙවිය 2013 වසරේදී 13.1%කින් වර්ධනය විය. එයට වැඩි දායකත්වයක් සැපයුවේ චීන ලොතරැයි වෙළඳපොළ විසිනි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකාවේ වෙළඳපොළේ 100%ක් ම හිමි ලොතරැයි සමාගම් දෙකෙන් එකක් වන අතර ඒ දෙක ම රජයේ ව්‍යවසාය වෙති. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාව අනුව මෙම සමාගම් දෙක රු. බිලියන 26.62ක ආදායමක් ලබා ඇති අතර ලැබූ ලාභය රු. බිලියන 2.45කි. ලොතරැයි කර්මාන්තය රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 0.28%කට දායක වෙයි.

# තිරසර වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාමාන්‍ය ලොතරැයි හයක් හා ක්ෂණික ලොතරැයි තුනක් මගින් ජනනය කරන සම්පූර්ණ ලාභය ජනාධිපති අරමුදලට බැර කරන අතර එය සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවලට දායකත්වය සපයයි. මුදල් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාව අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ පංගුව 41% කි. කර්මාන්තයේ සමස්ත ආදායම 2013දී 23%කින් වර්ධනය විය. ලොතරැයි ආයතන දෙක විසින් 2013දී ටිකට් පත් මිලියන 1168ක් අලෙවි කරනු ලැබූ අතර 2013දී තෑගි ලෙස රු. බිලියන 13.6ක් ලබා දෙන ලදී. 2012දී ලබා දෙන ලද තෑගිවල වටිනාකම රු. බිලියන 10.7කි.

විවරණයට ලක් වන වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2012දී ලබා ගත් රු. බිලියන 8.6ක ආදායම 23.03%කින් වර්ධනය කර ගනිමින් රු. බිලියන 10.6 දක්වා වර්ධනය කර ගත්තේ ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමස්තයක් ලෙස රු. මිලියන 6480.1ක් තෑගි ලෙස පිරිනමන ලදී. 2012දී පිරිනමන ලද තෑගි මුදල රු. බිලියන 5113.9ක් වූ අතර 2013දී 26.7%ක වර්ධනයක් සිදු විය. 2013 වසරේදී ගෙවන ලද තෑගි මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසයේ ගෙවන ලද වැඩි ම තෑගි මුදල වේ.

**සමාජ වගකීම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දිගට ම සමායතන පුරවැසි ආචාරධර්ම සංකල්පය ගැන සැලකිලිමත් වෙමින් සමාජමය වශයෙන් දැනුවත් ව්‍යාපාරික හවුල්කරුවන් හා පාරිභෝගිකයන් ආකර්ශනය කරගෙන තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජය හා නියාමන ආයතන සමග ශක්තිමත් සම්බන්ධතා පවත්වාගෙන ගොස් තිබෙන අතර මූලික නියාමනයෙන් හා සමායතන පාලනයෙන් දුරස්ථ කාරණා කෙරෙහි අවධානය යොමු කර තිබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ආචාරධාර්මික සමායතන පුරවැසිභාවය සම්බන්ධයෙන් සලකන්නේ එය හුදෙක් ම ආයතනයෙන් පරිබාහිර ක්‍රියාකාරකම් ලෙස නො වේ. තම කළමනාකරණය හා කාර්ය මණ්ඩලය ද සමාජයේ ම සාමාජිකයන් ලෙස සලකන සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඔවුන්ගේ ජීව ගුණය හා වැඩ ජීවිතයේ තුලනය ගැන සිතමින් ජීවිත කාලය පුරා ම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් ලෙස පැවතීමට පොළඹවයි. ආදායම රජයට, අපගේ අනුග්‍රාහක ප්‍රජාවන්ට හා දේශීය පුන්‍යායතනවලට සැපයීමෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය රට හා ජනතාව වෙනුවෙන් කැප වෙයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනනය කරනු ලබන අතිරික්ත ආදායම ජනාධිපති අරමුදලට බැර කරනු ලබන අතර එහි මූලික අරමුණ වන්නේ සමස්ත ජාතියේ ම සෞභාග්‍යය උදා කිරීමයි. එම අරමුදලින් 50%ක් පමණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට බැර කෙරේ. එය යෙදවෙන්නේ අධ්‍යාපන ආධාර සඳහායි. සමස්ත ජනතාවගේ අනාගතය යහපත් කිරීම උදෙසා, දිළිඳු ජනයාගේ ජීවිත නඟා සිටුවීමට, සෞඛ්‍ය අවශ්‍යතා සඳහා, ආගමික ආයතන නඩත්තු කිරීම සඳහා, සුබසාධන සංගම් වෙනුවෙන් සහ ක්‍රීඩා හා කලා කටයුතු වෙනුවෙන් ඉතිරි මුදල යෙදවීමට පියවර ගනිමින් තිබේ.

මෙම වසරේ ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතිරික්ත ආදායමෙන් 99.01%ක් හෙවත් රු. මිලියන 2007.35ක් හෙවත් ආසන්න වශයෙන් රු. බිලියන දෙකක් ජනාධිපති අරමුදලට ලබා දෙන ලදී. එය 2012 වසරට සාපේක්ෂව 21%ක වර්ධනයකි. 2012දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට දක්වන ලද දායකත්වය රු. මිලියන 1648.47ක් හෙවත් බිලියන 164කට වැඩි ප්‍රමාණයක් විය.

ජනාධිපති අරමුදල පිහිටුවනු ලැබුවේ 1978දී ගෙන එන ලද පාර්ලිමේන්තු පනතක් ඔස්සේ ය. එහි අරමුණ වුණේ සම්පත් වෙත ප්‍රවේශය නැති දිළිඳු ජනතාවට විශේෂිත සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සපයා ගැනීමට උපකාර කිරීම හා ආගමික, සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමත් ය. විශේෂයෙන් ම වරප්‍රසාද නො ලැබෙන, පීඩිත ජන කොටස්වලට වාසි ලැබෙන පරිදි ජනාධිපති අරමුදලේ ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කර තිබේ. දිළිඳු ජනතාවට වැඩිපුර සේවා සපයන රජයේ රෝහල්වල නවීන පහසුකම් සහිත ශල්‍යාගාර ඉදි කිරීම ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු රැසකට ජනාධිපති අරමුදල විසින් ආධාර කර තිබේ.

නැසීගිය ගරු අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතා විසින් වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ වෙළඳපොළක් හා අධ්‍යාපනික ප්‍රදර්ශනයක් ලෙස 1980දී හඳුන්වා දෙන ලද මහපොළ සංකල්පයේ මුල් කාලීන අරමුණ වුණේ විවෘත ආර්ථිකයේ වාසි ග්‍රාමීය ප්‍රජාව වෙත යොමු කිරීමයි. මෙම හා වෙළඳ සල්පිල පාසල්වල සංවිධානය කෙරුණු අතර එහි ටිකට් පත් විකිණීමෙන් ලද ලාභය එකී පාසල්වලට මූලික පහසුකම් සැපයීම සඳහා යොදා ගැනිණි. වර්තමානයේදී මහපොළ ශිෂ්‍යත්ව දෙයාකාරයකට පිරිනමනු ලැබේ. ඒ කුසලතා ශිෂ්‍යත්ව හා සාමාන්‍ය ශිෂ්‍යත්ව ලෙසයි. කුසලතා ශිෂ්‍යත්ව පිරිනමනු ලබන්නේ අ.පො.ස. උසස් පෙළ විභාගයේදී ඉහළ ම සුදුසුකම් ලබන සිසුන්ටයි. සාමාන්‍ය මහපොළ ශිෂ්‍යත්ව පිරිනමනු ලබන්නේ පහළ ආදායම්ලාභී පවුල්වලින් පැවත එන සිසුන්ට කුසලතා පදනම මතයි. පිරිනමනු ලබන ශිෂ්‍යත්වවලින් 10%ක් කුසලතා පදනම මත පිරිනමනු ලබන අතර 90% ක් සාමාන්‍ය ශිෂ්‍යත්වයි. කුසලතා පදනමේ ශිෂ්‍යත්වවලට රු. 50ක් වැඩිපුර ගෙවනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දැයට කිරුළ ප්‍රදර්ශනයේ ප්‍රධාන මූල්‍ය අනුග්‍රාහකයා ය. පසුගිය මූල්‍ය වර්ෂයේදී එය මාර්තු 23 සිට 30 දක්වා අම්පාරේදී පවත්වනු ලැබූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජයේ සංවර්ධන සැලසුම් වෙනුවෙන් කරන කැපවීම නිරූපණය කරමින් රු. මිලියන 100ක අනුග්‍රාහකත්වයක් පිරිනමන ලදී. එසේම, ප්‍රවේශපත් සඳහා

දිනුම් ඇදීමෙන් මෙම ජාතික සංවර්ධන ප්‍රදර්ශනය නැරඹූ ජනතාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. මිලියන 66ක ත්‍යාග ද පිරිනමන ලදී. විශේෂ දිනුම් ඇදීමෙන් ත්‍රිරෝද රථ අටක්, මෝටර් සයිකල් අටක්, බයිසිකල් 40ක් සහ පෝසිලේන් කට්ටල 40ක් පිරිනමන ලදී. සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ටිකට් පත් අලෙවියේදී ලබා දෙන ලද සේවා වෙනුවෙන් යුද හමුදා සුබසාධන අංශයට රු. මිලියන 3.3ක ප්‍රදානයක් කරන ලදී.

අපගේ සමායතන සමාජ වගකීම අපගේ බෙදාහරින්නන් හා අලෙවිකරුවන්ගේ ජීවිත නඟා සිටුවීමේ මුලපිරුම් වෙත ද යොමු වේ. විවරණයට ලක් වන වසර තුළ දිස්ත්‍රික් 12ක අපි දහස් ගණනක් ව්‍යාපාරික හවුල්කරුවන්ට බයිසිකල්, ට්‍රයිසිකල් හා ඇස් කණ්ණාඩි පිරිනැමුවෙමු. මෙම වැඩසටහන ඉදිරි කාලයේදී උතුරු නැගෙනහිර පළාත් වෙත ද ව්‍යාප්ත කිරීමට ඉලක්ක කර තිබේ.

අපගේ ව්‍යාපාර ජාලයේ හවුල්කරුවන්ගේ ජීවිත නඟා සිටුවීම පිණිස අප විසින් පිරිනමන ලද බයිසිකල්, ට්‍රයිසිකල් හා ඇස් කණ්ණාඩි සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| දිස්ත්‍රික්කය | ස්ථානය | බයිසිකල් | ට්‍රයිසිකල් | ඇස් කණ්ණාඩි |
|---|---|---|---|---|
| හම්බන්තොට | රාහුල මහා විද්‍යාලය - තංගල්ල | 50 | 10 | 324 |
| හම්බන්තොට | වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය - තිස්සමහාරාමය | - | - | 235 |
| ගම්පහ | රන් අරුණලු මධ්‍යස්ථානය | 50 | 12 | 450 |
| කුරුණෑගල | යකරවත්ත හා කුලියාපිටිය | - | - | 600 |
| කුරුණෑගල | කුරුණෑගල නාගරික ශ්‍රවණාගාරය | 108 | 14 | 520 |
| කලුතර | කලුතර දිසා ලේකම් කාර්යාලය | 43 | 28 | 400 |
| කලුතර | සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි | 20 | 3 | 250 |
| මාතර | සනත් ජයසූරිය ක්‍රීඩාංගනය | 37 | 24 | 375 |
| මාතර | අමලගොඩ විද්‍යාලය - අකුරැස්ස | - | - | 125 |
| පොළොන්නරුව | පොළොන්නරුව | 12 | 1 | 375 |
| අම්පාර | මහින්ද මහා විහාරය | 29 | 03 | 290 |
| මඩකලපුව | YMCA - මඩකලපුව | 10 | 01 | 195 |
| මහනුවර | කැප්පෙටිපොළ ශාලාව | 45 | 06 | 510 |
| රත්නපුර | සීවලී පිටිය | 46 | 02 | 375 |
| ගාල්ල | ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය | 80 | 20 | 520 |
| එකතුව | | | | |

# තිරසර වාර්තාව

මේවාට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය මණ්ඩලයේ සේවකයන්ගේ අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් දස්කම් දක්වන ලද දරුවන්ට ශිෂ්‍යත්ව 55ක් ද පිරිනැමුවේ ය.

| විශ්වවිද්‍යාලයේ නම | ශිෂ්‍යත්ව ලැබෙන සිසුන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 9 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 6 |
| ගම්පහ වික්‍රමආරච්චි විශ්වවිද්‍යාලය | 2 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 5 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 7 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 8 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 2 |
| පේරාදෙනිය විශ්වවිද්‍යාලය | 7 |
| විවෘත විශ්වවිද්‍යාලය | 1 |
| දෘෂ්‍ය කලා හා රංග කලා විශ්වවිද්‍යාලය | 3 |
| වයඹ විශ්වවිද්‍යාලය | 2 |
| ආරක්ෂක විශ්වවිද්‍යාලය | 1 |
| SSSLIIT | 1 |
| සාගර විශ්වවිද්‍යාලය | 1 |
| එකතුව | **55** |

ඉහත ශිෂ්‍යත්වවලට අමතරව, අපගේ සේවකයන්ගේ ජාතික විභාගවලදී දක්ෂතා දක්වන ලද දරුවන්ට තවත් ශිෂ්‍යත්ව හයක් පිරිනමන ලදී.

පහත සඳහන් සමායතන සමාජ වගකීම් ව්‍යාපෘති යොමු වුණේ ආගමික කටයුතු වෙනුවෙනි.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 30 වන සංවත්සරය වෙනුවෙන් පිරිත් සජ්ඣායනයක් හා දානමය පිංකමක් 2013 ජනවාරි 18ල 19 දිනවල ආයතන පරිශ්‍රයේදී පැවැත්විණි.
- 2013 මැයි 28 දින 2000කගේ සහභාගිත්වයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සාර්ථක වෙසක් දන්සැලක් පවත්වන ලදී.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගල් අතුරා දළදා මාළිගාවේ මං පෙත් ප්‍රතිසංස්කරණය කරන ලදී.
- ඓතිහාසික සිතුල්පව්ව රජ මහා විහාරයේ රන් ආලේපිත වැටක් ඉදිකිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනුග්‍රහය පිරිනමන ලදී.
- මහනුවර ඇසළ පෙරහර, කතරගම පෙරහර, කොළඹ වෙසක් කලාපය ඇතුළු ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් ගණනාවකට ම 2013 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලබා දෙන ලදී.

## පාරිසරික වගකීම

පාරිසරික බලපෑම අවම කිරීමේ අරමුණින් අප විසින් දියත් කරනු ලැබූ සාර්ථක සමායතන සමාජ වගකීම් ව්‍යාපෘතිවල සංවර්ධනය පිළිබඳව අපි ආඩම්බර වෙමු.

මෙම වසර තුළ අපි ආයතනයේ භාවිතා කළ පැරණි වාහන, යතුරුපැදි හා බයිසිකල් හා වෙනත් නැවත පාවිච්චි කළ හැකි ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් රු. මිලියන 6.3ක් ඉපැයුවෙමු. එසේම අපගේ ව්‍යාපාර ජාලය හරහා එක්රැස් කරනු ලබන දිනුම් ටිකට්පත් සෑම මාස හයකට ම වරක් ප්‍රතිචක්‍රීයකරණය සඳහා යවනු ලැබේ.

වෘත්තීය පුහුණුව, නව නිර්මාණාත්මක තාක්ෂණය හා හවුල්කරුවන් සමග සහයෝගය ඔස්සේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කාර්යක්ෂම ප්‍රජා සත්කාර සේවාවකට දොරටුව විවෘත කර තිබේ.

පාරිසරික සෞඛ්‍යය, ආර්ථික ශක්තිය හා ප්‍රජාවන්ගේ ගුණය හා අනාගත පරම්පරාවල ජීවන තත්වය වැඩි දියුණු කරන ව්‍යාපාර භාවිතාවන් වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැප වී කටයුතු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම අවම කිරීම සඳහා සේවකයන්ගේ හා පාරිභෝගිකයන්ගේ හරිත ඥානය වැඩි දියුණු කිරීමට අපි අදහස් කරන්නෙමු.

මෙම වසරේ වාර්තාව අපගේ සමාජ වගකීම් ප්‍රයත්නයන් සම්බන්ධයෙන් මූලික ලේඛනය ලෙස සැලකිය හැකි ය. සෑම වසරක ම මෙම වාර්තාව ඔස්සේ අපි මෙම ක්ෂේත්‍ර ඔස්සේ අප ලබන ප්‍රගතිය ඉදිරිපත් කරන අතර ඉදිරි වසරවලදී අපගේ අරමුණු වචනගත කරනු ලැබේ. අවසාන වශයෙන් අපගේ අරමුණ වන්නේ රට තුළ අපගේ කර්මාන්තය සම්බන්ධයෙන් සමාජ වගකීම වාර්තා කරන ප්‍රමුඛ ම ආයතනය වීමයි.

# සාමූහික පාලනය

සමාගම් පාලනයෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ සමාගම් මෙහෙයවනු හා පාලනය කරනු ලබන ආකාරයයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය හා එහි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාග්‍රභාවය, විනිවිදභාවය හා වගවීම දිරිගන්වමින් සියලු හවුල්කරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන ආකාරයට පාලනයේ ඉහළ ම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට කැප වී සිටියි.

කොටස් හිමියන්, බෙදාහරින්නන්, අලෙවිකරුවන්, අලෙවි සහකාරවරුන්, පාරිභෝගිකයන්, සැපයුම්කරුවන්, ණය දෙන්නන් හා වෙනත් අය සම්බන්ධයෙන් තිබෙන වගකීම් මෙන් ම වඩා පුළුල් සමාජ වගකීම් ද වැදගත් ය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සියලු අදාළ නීති හා නියාමන රාමු සමග අනුකූල විය යුතු ය.

පහත සඳහන් කාරණාවලින් විවරණයට ලක් වන වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාගම් පාලන ව්‍යුහය හා භාවිතාවන් පැහැදිලි කෙරේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයාගේ නායකත්වයෙන් යුක්ත අතර ඔහු ප්‍රධාන විධායක නිලධාරිවරයා ද වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙහෙයවන ඉහළ ම ව්‍යුහයයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයාගෙන් හා අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකුගෙන් සමන්විත වේ. ඔවුන් පත් කර තිබෙන්නේ මෙසේ ය:

- ජනාධිපති අරමුදල
- මහපොළ භාරකාර අරමුදල
- මුදල් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය අදාළ ඇමතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් (එක් අයෙක් සභාපතිවරයා ය)

### සභාපති / ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වගකීම්

- සමාගම් පාලනය තහවුරු කළ යුතු ය.
- අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම්වල සභාපතිත්වය හොබවමින් එම රැස්වීම් මනාව මෙහෙයවිය යුතු ය.
- සියලු අධ්‍යක්ෂවරුන්ට සමානව සැලකිය යුතු අතර තමන්ගේ දැනුම ක්ෂේත්‍රයෙන් උපරිම දායකත්වය සපයමින් ඵලදායී ලෙස ක්‍රියා කිරීමට ඔවුන් පෙළඹවිය යුතු ය.
- සභාපතිවරයා ප්‍රධාන විධායක නිලධාරිවරයා ද නො වන්නේ නම් ඔහු සුපරීක්ෂණ භූමිකාවක යෙදිය යුතු අතර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සහභාගි නො විය යුතු ය.
- ව්‍යවසායෙහි සමස්ත තීරණ ගැනීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය අතට පත් කර ගැනීමට සභාපතිවරයා වග බලා ගත යුතු ය.
- සභාපතිවරයා පැහැදිලි ලෙස වගකීම් බෙදා ගන්නා බවට වග බලා ගත යුතු ය. අධිකාරිය හා බලය අතර තුලනය ඇති කළ යුතු ය.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

ව්‍යාපාරය රාජ්‍ය ප්‍රතිපත්ති අනුව කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරන බවට වග බලා ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට තිබේ. මෙය අත්පත් කර ගත යුත්තේ සම්පත් ආරක්ෂා කරන අතර, ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යමින්, නිවැරදි වාර්තා පවත්වාගෙන යමින්, නිසි ව්‍යවස්ථාවන් හා නියාමනයක් පවත්වාගෙන යමින් ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් කාරණා සහතික කළ යුතු ය:

- ව්‍යාපාරයේ උපායික අරමුණු අනුව කටයුතු කළ යුතු ය.
- උපායික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය දිය යුතු ය.
- ප්‍රධාන විධායක නිලධාරිවරයා හා කළමනාකරණය අවශ්‍ය දැනුම, කුසලතා හා නිපුණතා සහිත විය යුතු ය.
- අභ්‍යන්තර පාලනය හා අනතුරු කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යක්ෂම ක්‍රමයක් ඇති කර ගත යුතු ය.
- ව්‍යපාරයේ කළමනාකරණ කටයුතු කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කළ යුතු ය.
- මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් හා වෙනත් හෙළිදරව් කළ යුතු කාරණා සම්බන්ධයෙන් කොටස් හිමියන්ට නිසි පරිදි ස්ථාවරව වාර්තා කළ යුතු ය.
- සම්පත් වගකීමකින් යුතුව පරිහරණය කළ යුතු ය.
- අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුවක් හා වෙනත් කමිටු පත් කළ යුතු ය. සමාගම් පාලන මූලෝපාය වෙනුවෙන් ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දිය යුතු ය.
- අදාළ ව්‍යවස්ථා, මාර්ගෝපදේශ හා චක්‍රලේඛ ආදිය අනුව සියලු කටයුතු සකස් කර ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය.
- ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ හා ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලයේ කාර්ය සාධනය වාර්ෂිකව හෝ තක්සේරු කළ යුතු ය.

# සාමූහික පාලනය

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

මෙහෙයුම් හා ප්‍රතිඵල අයවැය හා අදාළ ප්‍රමිතීන් අනුව පවතීදැයි අධ්‍යක්ෂ මණ්ඩලය සමීපව හා ස්ථිරව අධීක්ෂණය කළ යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු විය යුතු වෙනත් කාරණා අඩංගු ප්‍රමිතිගත න්‍යාය පත්‍රයක් අනුගමනය කළ යුතු ය. සාමාන්‍යයෙන් මසකට වතාවක් ද විශේෂ රැස්වීම් අවශ්‍ය විටදී ද අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වේ.

2012 දෙසැම්බර් 31දායින් අවසන් වූ වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 හා ඒවායේ සහභාගිත්වය පහත වගුවේ දැක්වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා | සභාපති | 12/12 |
| 2. නිතිඥ ගාමිණි ඒකනායක මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 11/12 |
| 3. ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | 12/12 |
| 4. රංජිත් තේනුවර මහතා | අධ්‍යක්ෂ | 11/12 |
| 5. ආර්. කේ. ජයලත් මහතා | අධ්‍යක්ෂ | 11/12 |

### සංවර්ධන ලොතරැයි මණ්ලයේ කමිටු

- කළමනාකරණ කමිටුව
- විගණන හා කළමනාකරණ කමිටුව
- ප්‍රසම්පාදන මණ්ඩල කමිටුව
- සේවක සුබසාධන කමිටුව
- ප්‍රචාරණ කමිටුව
- සංස්කෘතික හා කලා සංගමය

### ආවසරික නිලධාරී

මුල්‍ය අංශයේ ප්‍රධානියා වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුල්‍ය) මගින් ආවසරික නිලධාරීවරයා නියෝජනය වන අතර හෙතෙම ව්‍යවස්ථාමය, නියාමන අවශ්‍යතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පාලනය කරන නියාමනයන් අනුව කටයුතු කිරීම සහතික කරයි.

### කළමනාකරණය

මණ්ඩලයේ දෛනික මෙහෙයුම් සම්බන්ධ වගකීම සභාපති / ප්‍රධාන විධායක නිලධාරී විසින් නායකත්වය දරනු ලබන ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට පැවරේ. අවස්ථා හා අවදානම් හඳුනා ගනිමින් නියමිත කාල රාමුව තුළ හා අයවැය සීමා තුළ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඔවුන් විසින් පියවර ගනු ලැබේ.

# විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

**2013 -12 -31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය මූල්‍ය හා කළමනාකරණ කමිටුවේ වාර්තාව**

**විගණන කමිටුවේ සංයුතිය**

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| 1. | රංජිත් තේනුවර මහතා | සභාපති, විගණන හා කළමනාකරණ කමිටුව |
| 2. | ඩී.එන්. නානායක්කාර මහතා | සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව |
| 3. | පී.කේ. ජයලත් මහතා | සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව |

**විගණන කමිටුවේ භූමිකාව**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හවුල්කරුවන්ගේ අවශ්‍යතා හා මණ්ඩලයේ දේපල ආරක්ෂා කරන මනා අභයන්තර පාලනයක් පවත්වාගෙන යා යුතු ය. මුදල් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය හා වෙනත් බලයලත් ආයතන විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), පරිපාලන කළමනාකාර, අභ්‍යන්තර විගණන හා වෙනත් අදාළ නිලධාරීහු රැස්වීම්වලට සහභාගි වෙති. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අධිකාරීවරයා නිරීක්ෂකවරයකු ලෙස කමිටුවට සහභාගි වෙයි.

**විගණන කමිටුවේ රැස්වීම් සංඛ්‍යාව**

මාසික පදනමින් පවත්වන ලද රැස්වීම් 12 සහභාගිත්වය පහත දැක්වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගිත්වය | සහභාගි නොවීම් |
|---|---|---|
| රංජිත් තේනුවර මහතා | 12/12 | Nil |
| ඩී.එන්. නානායක්කාර මහතා | 12/12 | Nil |
| පී.කේ. ජයලත් මහතා | 11/12 | 01 |

කමිටුව නිරතුරුව ම දැනට පවතින ක්‍රම හා ක්‍රියාවලි විවරණය කළේ ය. අභ්‍යන්තර පාලනය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, නීති, රෙගුලාසි හා සමාගම් පාලනයේ වෙනත් යහභාවිතාවන් සමග අනුගත වීම යන කරුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කළේ ය.

අයවැය සැකසීමේදී හා වියදම් කිරීමේදී අභ්‍යන්තර පාලනය හා කළමනාකරණ අඩුපාඩු වැනි වඩා වැදගත් කාරණා කෙරෙහි කමිටුව මෙම වසරෙහිදී අවධානය යොමු කළේ ය. කමිටුවේ නිර්දේශ පිළිගෙන ක්‍රියාත්මක කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාවලියක් පැවැත්විණි.

විවරණයට ලක් වූ වසර තුළ කමිටුව සේවකයන්ගේ ප්‍රතිලාභ, කාර්යසාධනය, සම්පත් මැනැවින් භාවිතා කිරීම හා මණ්ඩලයේ මෙහෙයුම් කාර්යසාධනය වර්ධනය කිරීමේ උපායමාර්ග පිළිබඳව විවරණය කරන ලදී. එසේම ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති සම්පත් සැලසුම් මෘදුකාංගවල අභිමතාර්ථ පිළිබඳව ද කමිටුව විසින් වැඩිදුරටත් විවරණය කරන ලදී.

මාසික රැස්වීම්වලදී කමිටුව විසින් තමන් වෙත ලැබුණු තොරතුරු බෙදා ගන්නා ලදී.

**රංජිත් තේනුවර මහතා**
සභාපති, විගණන සහ කළමණාකරන කමිටුව

# අවදානම් කළමනාකරණ වාර්තාව

**අවදානම් කළමනාකරණ විවරණය**

අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණයේ කොටසකි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ව්‍යවසාය අවදානම් කළමනාකරණ වැඩ රාමුව ඔස්සේ ප්‍රධාන සංවිධාන ක්‍රියාවලි තුළට අවදානම් කළමනාකරණ භාවිතාව ඵලදායී ලෙස අඩංගු කිරීමට කටයුතු කරයි. සිය ව්‍යාපාර අවදානම් තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ ස්ථාවර ප්‍රවේශයක් පිහිටුවීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අභ්‍යන්තර හා බාහිර සාධක සහ සිද්ධිවල බලපෑම කාර්යක්ෂමව ආමන්ත්‍රණය කරන්නටත්, එමගින් ව්‍යාපාර අරමුණු හා අභිමතාර්ථ සාධනයටත් අවස්ථාව ලැබේ.

**අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රවේශය**

අවදානම් කළමනාකරණය සංවිධානයේ සෑම සේවකයකුගේ ම වගකීමකි. අපගේ ආයතනය තුළ විධිමත් ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රමයක් (ERM) ක්‍රියාත්මක වේ. එමගින් අවදානම් කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩභාවය හා අර්බුද කළමනාකරණය ආවරණය වේ. අභ්‍යන්තර ප්‍රමිති හා අවශ්‍යතා සමග අනුගත සමායතන අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යයේ වගකීම ERM වෙත පැවරේ. අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵල මණ්ඩලයේ විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෑම කාර්තුවකදීම දැනුම් දෙනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය පදනම් වන්නේ ඉහත සඳහන් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රතිපත්ති රාමුව මත හා පහත සඳහන් වන දර්ශනය හා මූලධර්ම මත ය.

**අවදානම් කළමනාකරණ දර්ශනය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාර්ථකත්වය සඳහා යෝග්‍ය තරමට අවදානම් දරාගැනීමට සිදු වේ. ERM මගින් එකී අවදානම වගකීම්සහගත ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා විනයක් හා ව්‍යුහයක් සැකසේ. අවදානම ගැන දැනුවත් කිරීම සමාගම් සංස්කෘතියේ කොටසකි. අවදානම කළමනාකරණය කර ගැනීමේ වගකීම සේවකයන්ට පැවරේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර භාවිතාවට අවදානම් කළමනාකරණය ඇතුළත් කිරීම ඔස්සේ සමාගම් වටිනාකම් හා වගවීම ද, ඒකාග්‍රභාවය හා ගරුත්වය ද සේවකයන් වෙතින් ප්‍රදර්ශනය වීම අපේක්ෂා කෙරේ.

මෙම දර්ශනය පදනම් වන්නේ පහත සඳහන් අවදානම් කළමනාකරණ මූලධර්ම මත ය.

**අවදානම් කළමනාකරණය,**

- වටිනාකම් නිර්මානය කරයි; රැක ගනියි
- සියලු සංවිධානමය ක්‍රියාවලිවල අභ්‍යන්තර කොටසකි
- තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසකි
- බාහිර වශයෙන් අවිනිශ්චිතභාවය ආමන්ත්‍රණය කරයි
- විධිමත්, ව්‍යුහාත්මක හා කාලීන වේ
- පවතින හොඳම තොරතුරු මත පදනම් වේ
- තත්වයන්ට ගැලපෙන සකසාගෙන තිබේ
- මානව හා සංස්කෘතික කාරණා සැලකිල්ලට ගනියි
- පාරදෘෂ්‍ය හා අන්තර්ග්‍රාහී වේ
- වෙනස කෙරෙහි සුබවාදී ලෙස ප්‍රතිචාරාත්මක වේ
- සංවිධානයේ අඛණ්ඩ වර්ධනයට පහසුකම් සපයයි

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය අවදානම් රැසකට මුහුණ දෙයි. එම අවදානම් හා ඒවා අවම කිරීමට ගනු ලබන පියවර පහත සාකච්ඡා වේ.

**මූලෝපායික අවදානම**

සමාගමේ අරමුණු හා අභිමතාර්ථ සාධනයෙහිදී බලපෑමක් ඇති කළ හැකි, කාර්යක්ෂම ලෙස සම්පත් ලබා දීම කෙරෙහි බලපෑ හැකි, සමාගමේ අරමුණු හා අභිමතාර්ථ සාධනයෙහි ලා ප්‍රධාන මුලපිරුම් අසාර්ථක කරන, ප්‍රධාන හවුල්කරුවන් සමග සම්බන්ධතා අවදානමට ලක් කරන, ගරුත්වයට හානි කරන බාහිර පාරිසරික සාධක හා සිදුවීම් මුලෝපායික අවදානමට අඩංගු වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය බාහිර පරිසරයෙහි අවදානම් පිළිබඳව වෙළඳපොළ අධ්‍යයන හරහා පර්යේෂණ කිරීමට, හඳුනා ගැනීමට හා අවබෝධ කර ගැනීමටත්, ප්‍රධාන පෙළේ නිෂ්පාදන හා ක්‍රියාවලි පිළිබඳ මුලෝපායික සැලසුම් සැකසීමටත් කැප වී කටයුතු කරයි. බැරෑරුම් ලෙස වාර්ෂිකව ව්‍යාපාර සැලසුම් කිරීම කළමනාකරණය තුළට අඩංගු වේ. ඒ වෙනුවෙන් රජයේ අයවැය ක්‍රියාවලිය තුළ එයට කීර්තියක් හිමි වී තිබේ.

කළමනාකරණය විසින් විධිමත් ව්‍යාපෘති ක්‍රමවේදයක් ස්ථාපනය කර තිබේ. ප්‍රධාන හවුල්කරුවන් සමග කාර්යක්ෂම ලෙස සන්නිවේදන ක්‍රියාවලියක් සංවර්ධනය කිරීමෙහි හා පවත්වාගෙන යාමෙහි නියුතුව සිටියි.

යහපත් සමායතන පුරවැසියකු ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ සමාජ වගකීම් වැඩසටහන් හා මුලපිරුම් කෙරෙහි ද කැප වී කටයුතු කරයි.

### තෑගි ගෙවීමේ අවදානම

සෑම ලොතරැයි අලෙවියකදී ම සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෑගි ගෙවීමේ අනුපාතිකයක් පවත්වාගෙන යනු ලැබේ. තෑගි අනුපාතිකය ඉහළ යාමෙන් අපගේ ව්‍යාපාරයේ ලාභය අඩු වීමේ අවදානමක් තිබේ. කෙසේ වෙතත්, එකී අවදානම ආවරණය කිරීම සඳහා මුද්‍රණකරුවන්ගෙන් ලබා ගත් රක්ෂණාවරණයක් තිබේ.

### ආර්ථික අවදානම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන පරිසරය පාරිභෝගිකයන්ගේ මිළ දී ගැනීම් රටාව කෙරෙහි බලපෑමක් ඇති කරයි.

### මූල්‍ය අවදානම

ලාභය හා මූල්‍ය තොරතුරු කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කළමනාකරණය නො කිරීම මූල්‍ය අවදානමකි. එමගින් සමාගමේ තීරණ ගැනීමේ හැකියාවට බලපෑමක් ඇති වේ.

### ද්‍රවශීලතා අවදානම

ඉහළ වටිනාකමක් ඇති තෑගි මුල් අවධියේදී ජයග්‍රහණය කිරීම නිසා ද්‍රවශීලතා අවදානමක් ඇති විය හැකි ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එවැනි අවස්ථාවලට මුහුණ දීම සඳහා ඉහළ ද්‍රවශීලතා සම්පත් මට්ටමක් නඩත්තු කරනු ලැබේ.

### මෙහෙයුම් අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කාර්යක්ෂම නො වීම, පාරිභෝගික අවශ්‍යතා නො සැපිරීම, සංවිධානයේ වැදගත් මූල්‍ය දේපල ආරක්ෂා නො වීම මෙහෙයුම් අවදානම් ගණයෙහි ලා සැලකේ.

තාක්ෂණය, මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික සංසිද්ධි නිසා ද මෙහෙයුම් අවදානම වැඩි වේ. ටිකට්පත් වංචනික ලෙස වෙනස් කිරීම, කාර්ය මණ්ඩලයේ නො සැලකිල්ල, පරිගණක පද්ධතිවල වැරදි හා අසාර්ථක වීම්, වැසි, ගංවතුර, සුනාමි, නියඟ වැනි ස්වාභාවික විපත් ආදියෙන් ද බලපෑමක් ඇති වේ. බදු පැනවීම, අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර පරීක්ෂා, සංකීර්ණ පරිගණක වලංගුකරණ ක්‍රියාවලි, අභ්‍යන්තර විගණන ආදිය පැවැත්වෙන්නේ එවැනි අවදානම් ආවරණය කිරීම සඳහා ය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඵලදායී ලෙස සිය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හා පාරිභෝගිකයන් වෙත සම්පාදනය කිරීමටත්, වත්මන් හා අනාගත මෙහෙයුම් අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය බඳවා ගැනීම්, පුහුණුවීම් ආදිය සිදු කිරීමටත්, තොරතුරු තාක්ෂණ කළමනාකරණය හා සම්බන්ධව ඇති අවදානම් පාලනය කර ගැනීමටත් යෝග්‍ය ක්‍රියාවලි සකස් කර තිබේ.

මෙහෙයුම් ඒකකවල, මහා පරිමාණ ව්‍යාපෘතිවල හා විශේෂිත ව්‍යාපාර ක්‍රියාවලිවලත්, අඛණ්ඩ සංවර්ධනය සඳහා දිරි දෙන ක්‍රියාකාරී සැලසුම්වලත් පවතින අවදානම කළමනාකරණය විසින් නිරතුරුව ම විවරණය කර තක්සේරු කරනු ලැබේ.

### කීර්තිය පිළිබඳ අවදානම

කීර්තිය පිළිබඳඅවදානම යනු සංවිධානය කෙරෙහි මහජන විශ්වාසය අහිමි වීමේ අවදානමයි. දෘෂ්‍ය මාධ්‍ය මත දැඩි ලෙස රඳා පැවතීම, සමරු කලාප සඳහා සහාය පැතීම හා මහජන අභිලාෂයන් හේතුවෙන් ඇති වන අවදානමක් තිබේ. මේවා ද සමීපව අධීක්ෂණය කරනු ලබන අතර මාධ්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් කෙරෙන සෑම ඉල්ලීමක් ම හා අදහස් දැක්වීමක් ම සැලකිල්ලට ගෙන ඒවා නිකුත් කිරීමට පෙර ඒවායේ තත්වය හා නිවැරදි වචන භාවිතය තහවුරු කරනු ලැබේ.

### නීතිමය අවදානම

නිතිමය අවදානම ඇති වන්නේ කලින් අපේක්ෂා නො කරන ලද ගනුදෙනු හා මණ්ඩලයට එරෙහි නීතිමය ක්‍රියාමාර්ගවලට සාර්ථක ලෙස මුහුණ දීමට අසමත් වීම නිසා ය. නිති හා වෙනත් ක්ෂේත්‍රවල වෘත්තිකයන් වෙතින් අවශ්‍ය උපදෙස් ලබාගෙන එවැනි අවදානම් මතු විය හැකි අවස්ථා වළක්වා ගනු ලැබේ.

### තොරතුරු තාක්ෂණ අවදානම

ප්‍රධාන පරිගණක පද්ධතිවල නිවැරදි හා කාලීන තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අතිශය වැදගත් වේ. තොරතුරු තාක්ෂණ යටිතලය නවීකරණයට හා භාවිතා කරනු ලබන මෘදුකාංග යාවත්කාලීන කිරීමට සැලසුම් සකස් කර තිබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR-GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: FB/A/DLB/12
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 31st December 2014

සභාපති,

සංවර්ධන ලොතරැයි මණ්ඩලය.

**<u>සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශයතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය

විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අත්පත් කර ගත් රු.90,679,944 ක්වූ දේපල පිරියත හා උපකරණ මත වන විලම්භිත බදු මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොත්බුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18

ප්‍රමිතියට පටහැනිව එකතු කළ අගය මත බදු රු.448,943,791 ක් ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ ලොතරැයි ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය වීය.

(අ) අලෙවි නියෝජිතයන් විසින් මණ්ඩලයේ තැන්පත් කර ඇති මුදල් ආයෝජනය කිරීමෙන් ඉකුත් වර්ෂ වෙනුවෙන් ලද පොළී රු. 26,698,045 ක් ආදායමක් ලෙස හදුනාගන්නවා වෙනුවට ගෙවිය යුතු බැරකමක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) මණ්ඩලයේ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුතු මුදල රු.2,052,000 ක් වුවත්, මණ්ඩලය විසින් රු.8,089,439 ක් ගෙවා තිබීම හේතුවෙන් වැඩිපුර ගෙවීම රු.6,037,439 ක් විය.

(ඇ) ලොතරැයි අලෙවි නියෝජිතයන් සඳහා සියයට 50 ක් ආපසු අය කර ගැනීමේ පදනම මත ලබා දී ඇති යතුරු පැදි ණය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 845,797 ක් වුවද, අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් මණ්ඩලය දරා ඇති රු.815,412 ක් ද ඇතුළත් කර සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ණය ශේෂය රු.1,661,209 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් ඇණවුම් කර 2008 අප්‍රේල් 22 දින මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති රු.8,095,000 ක් වටිනා ඩබල්කැබ් රථය එවකට සිටි සභාපතිවරයා විසින් සැපයුම්කාර සමාගමෙන් භාර ගෙන තිබුණ ද එය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විට ද මණ්ඩලය වෙත ලැබී නොතිබුණි. එම රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල පිරියත උපකරණ තුළ අන්තර්ගත කර අදාල වටිනාකම පුද්ගලික ආයතනයකට ගෙවිය යුතු බැරකමක් ලෙද දක්වා තිබුණ අතර ඩබල් කැබ් රථය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,619,000 ක ක්ෂය ප්‍රතිපාදන ද සලසා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | | |
| 1. | 9 (1), (2) සහ (3) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාර ලොතරැයි සම්බන්ධයෙන් රීති සකස් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රය පල කිරිමෙන් තොරව ඉකුත් වර්ෂ වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් ලොතරැයි පවත්වාගෙන ගොස් තිබුණි. |
| 2. | 11 (1) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරිමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම මණ්ඩලයේ කර්තව්‍ය වුවද ඊට පටහැනිව මණ්ඩලය විසින් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එසේ ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරිමෙන් තොරව රු.462,000,000 ක් දැයට කිරුළ උත්සවය පවත්වන දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| 3. | 18(2) වගන්තිය | මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ඉකුත් වර්ෂවල දී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද රු.8,699,452.431 ක්වූ මණ්ඩලයේ සියලුම වියදම්දරා තිබුණි. |

(ආ) 1994 ජුනි මස 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර භාණ්ඩාගාරඅනුමැතිය ලබා ගැනීමෙන් තොරව දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා 2003 ජුනි 02 දිනැති ඉකුත් වර්ෂ වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය දිරි දීමනාලෙස රු. 40,022,081 ක් ගෙවා තිබුණි. සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| ඇ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 1. 8.3.5 (උ) වගන්තිය | හිමිකමක් නොමැති නිලධාරින් සඳහා නිල වාහන අනුයුක්ත කර ඉන්ධන වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,252,560 ක් වැය කර තිබුණි. |
| 2. 9.7 වගන්තිය | 1. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ලොතරැයි දිනුම් ඇදීමේ සහභාගිත්ව දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.18,080,640 ක් ගෙවා තිබුණි. |
| | 2. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අලෙවි ප්‍රවර්ධන නිලධාරින්ගේ දෛනික දීමනාව ලෙස රු.2,379,000 ක් ගෙවා තිබුණි. |
| | 3. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ 30 වන සංවත්සරය නිමිත්තෙන් රු.16,500.000 ක් වැය කර රන්කාසි 500 ක් මිලදී ගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට සේවකයින් අතර රන්කාසි 230 ක් බෙදා දී තිබුණි. |
| (ඇ) 2009 ජුනි 01 දිනැති අංක 34 (1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව විවිධ ප්‍රමාණයන් (Rate) පදනම් කරගෙන රු.1,954,400 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සංයුක්ත දීමනා ලෙස ගෙවා තිබුණි. |

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුළී පදනම මත ලබා ගැනීම පිණිස 2003 නොවැම්බර් 01 දින වෙළඳ අමාත්‍යාංශය වෙත රු. 8, 685, 360 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ ද, පසුව මණ්ඩලය විසින් එම ගොඩනැගිල්ල කුළී පදනමට ලබා ගැනීමට තීරණය කර තිබුණි. ගෙවන ලද අත්තිකාරම් මුදලින් තවදුරටත් ලැබිය යුතු රු. 5, 700, 000 ක මුදල 2013 දෙසැම්බර් 31 දිනට අය වී නොතිබුණි. මණ්ඩලය විසින් මෙම අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචන වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් අතිරික්තය රු. මිලියන 2, 126 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 1, 938 කි. ඒ අනුව, පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 188 ක හෙවත් සියයට 9.7 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මණඩලයේ 30 වන සංවත්සරයට සමගාමීව සංවත්සර වාසනා ලොතරැයිපතක් වෙළඳපලට ඉදිරිපත් කර තිබුණි. එම ලොතරැයිපත්වලින් 3, 054, 480 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කළ ද තත්‍ය ආලෙවිය ලොතරැයිපත් 1, 337, 220 ක් එනම් සියයට 44 ක් වූ අතර ජයග්‍රාහකයින් 3, 809 ක් පමණක් බිහිකර තිබුණි. අපේක්ෂිත අලෙවි ඉලක්කය සපුරා ගැනීම සඳහා රු. 8, 000, 000 ක ප්‍රචාරණ වියදමක් ඇස්තමේන්තු කර තිබුණ ද, තත්‍ය වියදම රු. 10, 967, 877 ක් වූයෙන් ප්‍රචාරණය වියදම සියයට 37 කින් ඉහළ ගොස් තිබුණ ද අලෙවි ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද හයිවේ ඩ්‍රීම් (Highway Dream) ලොතරැයිය මඟින් රු. 292, 150, 400 ක ශුද්ධ අලෙවි ආදායමක් උපයා තිබුණ ද ශුද්ධ ආදායමෙන් රු. 250, 150, 400 ක් එනම් සියයට 85 ක් ත්‍යාග සඳහා වෙන්කර තිබුණ අතර

අනෙකුත් ඍජු වියදම් හා ගණනය කළ හැකි අදාළ පිරිවැය අඩුකළ පසු ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කළ හැකි මුදල රු. 6, 228, 053 ක් එනම්, ආදායමින් සියයට 2ක් පමණ අඩු අගයක් විය.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පරිබාහිරව මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග සැපයුම්කරුවකු තෝරාගෙන 2009 සිට 2014 දක්වා වසර 05 ක සේවා ගිවිසුමකට එළඹ තිබූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට එම සමාගමට ගෙවා තිබූ මුදල රු. 58, 511, 176 ක් විය.

(ඈ) ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ඇති ගිවිසුම ප්‍රකාරව ඉහළ ගුණාත්වයෙන් හා නිවැරදිතාවයෙන් යුක්ත ටිකට්පත් සැපයීය යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් අවස්ථා ගණනාවකදී ඒ අනුව ක්‍රියා කර නොතිබුණ ද, මණ්ඩලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4. (අ) සහ (ආ) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ක්ෂණික ලොතරැයි අලෙවි ආදායම රු. 173, 199, 718 කින් එනම් සියයට 29 කින් පහළ යාමට මෙය හේතුවක් වී තිබු බව නිරීක්ෂණය විය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් සහ සුරක්ෂණයක් ලබාගැනීමෙන් තොරව එකතුව රු. 2, 241, 727, 950 ක "සුපර් බෝල්" හා "හයිවේ ඩ්‍රීම්" ටිකට්පත් ණය පදනම මත අලෙවි කර තිබුණි.

(ආ) පහත දැක්වෙන පරිදි 2012 වර්ෂයේ දී ලොතරැයි ආදායමෙන් සියයට 19 ක ප්‍රමාණයක් ජනාධිපති අරමුදලට බැර කර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂයේ දී සියයට 17 දක්වා අඩුවී තිබුණි.

| වර්ෂය | ලොතරැයි ආදායම | ජනාධිපති අරමුදලට යැවිය හැකි මුදල | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | |
| 2012 | 8, 624 | 1, 657 | 19 |
| 2013 | 10, 611 | 1, 811 | 17 |

(ඇ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී - 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම, එම චක්‍රලේඛයේ 6 (iii) හා (iv) වගන්ති ප්‍රකාරව රජයට පරිබාහිර පාර්ශවයන් වෙත ලබාදෙන රු. 100, 000 ඉක්මවූ අනුග්‍රහයන් සඳහා සහ ඕනෑම පාර්ශවයක් වෙත ලබා දෙන රුපියල් මිලියන 2 ඉක්ම වූ අනුග්‍රහයන් සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) අලෙවි ප්‍රචාරණය යටතේ අනුග්‍රාහකත්ව ආධාර ලබා දීමේ දී අයිතම තෝරා ගැනීම හා ඒවාට ලබාදෙන ආධාර ප්‍රමාණය තීරණය කිරීමේ නිර්නායක මණ්ඩලය විසින් හඳුන්වාදී නොතිබුණි. අනුග්‍රාහකත්ව හා ආධාර ලබා දී තිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

# විගණකාධිපති වාර්තාව

1. "සභාපති වැය විෂය" ගිණුම යටතේ සමාලෝචිත වර්ෂයේ රු. 2, 572, 225 ක අනුග්‍රාහකත්ව හා ආධාර ලබා දී තිබුණ අතර ඉන් රු. 1, 500, 000 ක් එනම් මුළු වියදමින් සියයට 60 ක් අනුග්‍රාහක අවස්ථා තනකට ලබා දී තිබුණි.

2. "සාමාන්‍ය ප්‍රචාරණ වියදම්" ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 64, 773, 026 ක් අනුග්‍රාහක කටයුතු සඳහා වැයකර තිබුණු අතර ඉන් අයිතම 30 ක් සඳහා වැය කර තිබූ මුදල රු. 200, 000 සිට රු. 3, 500, 000 අතර පරාසයක විය.

3. සාමූහික ප්‍රචාරණ වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රු. 69, 064, 164 ක් වැය කර තිබුණු අතර ඉන් සියයට 74 ක් එනම් රු. 50, 939, 998 ක් අයිතම 08 ක් වෙනුවෙන් වැය කර තිබූ අතර එය රු. 300, 000 සිට රු. 19, 900, 000 අතර පරාසයක වියදම් වලින් සමන්විත විය. ඒ අතරින් පෞද්ගලික සංවිධානයක ඉල්ලීම පරිදි උතුරු ප්‍රදේශයේ සංගීත ප්‍රසංග පැවැත්වීම වෙනුවෙන් වැය කර තිබූ මුදල රු. 19, 900, 000 කි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල බෙදාහැරීමේ වියදම් යටතේ දැක්වෙන ලොතරැයි ප්‍රචාරණ වියදම් හා සාමාන්‍ය ප්‍රචාරණ වියදම් වල එකතුව අලෙවි ආදායම් සමඟ සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ මුළු ප්‍රචාරණ වියදම් රුපියලකට රු. 27. 69 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම අගය රු. 25. 15 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රචාරණ වියදම් රුපියලකින් උපයා තිබූ අලෙවි ආදායම රු. 2. 54 කින් පහත වැටී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දිනුම් ඇදීම සඳහා මුද්‍රණය කරන ලද ටිකට්පත් 671, 887, 900 ක් සඳහා වූ පිරිවැය රු 410, 016, 327 ක් වූ අතර, අලෙවි නොවූ ටිකට්පත් සංඛ්‍යාව 83, 176, 950 ක් විය. එහි පිරිවැය රු. 45, 656, 399 ක් වූ අතර, එය මුළු ටිකට්පත් පිරිවැයෙන් සියයට 11 ක් විය.

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හා විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව වෙබ් අඩවියකට මණ්ඩලයේ වෙළඳ නාම සහ මණ්ඩලයේ නිල ලාංඡනය (Trade name and Logo) ප්‍රදර්ශනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,200,000 ක් ගෙවා තිබුණි.

(ආ) මණ්ඩලය සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් බාහිර පාර්ශවයක් මගින් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ඉටුකර ගැනීමට විධිමත් පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීමෙන් තොරව උපදේශකයෙකු කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන තිබුණි. අදාළ කාර්යය නිම කිරීම සඳහා නිශ්චිත කාල රාමුවක් මණ්ඩලය විසින් උපදේශක වෙත ලබා දී නොතිබුණ අතර උපදේශක විසින් ලබාදුන් කාල රාමුව අනුව 2013 වර්ෂය තුළ නිමකළ යුතු වැඩ කොටස් 2014 මාර්තු 31 දින වන විටත් නිම වී නොතිබුණි. මණ්ඩලය විසින් උපදේශක වෙත 2012 දෙසැම්බර් සිට 2013 දෙසැම්බර් 31 දක්වා රු. 1,005,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

### 4.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී රු.38,752,448 ක් වැය කර ලොතරැයි දිනුම් ඇදීම රූගත කිරීම සඳහා චිත්‍රාගාරයක් ඉදිකර තිබුණද එම චිත්‍රාගාරය රූගත කිරීම් කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 3 ත් 10 ත් අතර කාලයක සිට එකතු වටිනාකම රු. 1,698,310 ක් වූ අලෙවි ප්‍රවර්ධන භාණ්ඩ වර්ග 14ක් ගබඩාවේ පැවතුණි.

(ඇ) ක්ෂණික ලොතරැයිපත් තොග සම්බන්ධයෙන් 2013 ජූලි 13 දින විගණන පරීක්ෂාවේදී තරඟ වාර 15කට අදාළ පිරිවැය රු.3,427,500 ක් වූ ටිකට්පත් 3,857,457 ක් වසර 01 සිට වසර 04 කාලයක සිට නිකුත් නොවී ගබඩාවේ පැවතුණි.

### 4.5 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව 2009 වර්ෂයේ සිට තෝරා ගත් පෞද්ගලික සමාගමක් වෙතින් ශනිදා වාසනාව හා සංවර්ධන වාසනාව ලොතරැයි පතක් ශත 56 බැගින් මුද්‍රණය කරනු ලැබේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තෝරා ගනු ලැබූ සමාගමක් ජයෝදා ටිකට් පතක් 2010 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දක්වා ශත 48 බැගින් මුද්‍රණය කරනු ලැබේ. මේ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තෝරාගනු ලැබූ සැපයුම්කරුවකු මඟින් ශනිදා වාසනාව සහ සංවර්ධන වාසනාව ටිකට්පත් මුද්‍රණය කරවා ගැනීමට ක්‍රියා කලේ නම් එක් ටිකට් පතක් අවම වශයෙන් ශත 48 ක් බැගින් මුද්‍රණය කරවා ගැනීමට තිබුණේය යන පදනම මත ගණනය කළ විට 2009 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයට සිදුවී ඇති ගණනය කළ හැකි පාඩුව රු.74,922,840 ක් විය.

(ආ) විධිමත් පරිදි මිල ගණන් කැඳවීමෙන් තොරව හයිවේ ඩ්‍රීම් (Highway Dream) ටිකට්පත මුද්‍රණය කරවා ගැනීම නිසා මණ්ඩලයට සිදුවී ඇති ගණනය කළ හැකි පාඩුව රු.1,492,260 ක් බව නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 190 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 229 ක් විය. ඒ අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 45 ක් විය.

(ආ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2012 මාර්තු 06 දින සිට 2013 දෙසැම්බර් 31 දින අතර කාලය තුළ නිලධාරීන් 15 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා ගෙන තිබූ අතර ඉන් නිලධාරීන් 14 දෙනෙකු සඳහා මණ්ඩලය මඟින් තීරණය කර ගෙවනු ලබන මාසික දීමනාවට අමතරව ස්ථිර කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රසාද දීමනා, දිරි දීමනා හා වෛද්‍ය දීමනා වශයෙන් 2013 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව රු.2,533,696 ක් ද නිලධාරීන් 13 දෙනෙකු සඳහා සංවත්සර සැමරුම වෙනුවෙන් රන්කාසි 13 ක්ද ලබා දී තිබුණි.

(ඇ) චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනමින් රහස්‍ය ලේකම් හා අලෙවි උපදේශක තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණු අතර, විධිමත් බඳවා ගැනීමේ පටිපාටියෙන් තොරව ප්‍රධාන ආරක්ෂක නිලධාරියා බඳවා ගෙන තිබුණි. තවද, 2003 ජුනි 02 දිනැති අංක 12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ආරක්ෂක නිලධාරියකු වෙනත් ආයතනයකට මුදා හැර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවෘත තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සැපයුම්කරුවන් දෙදෙනෙකුගේ මිල ගණන් පමණක් සැලකිල්ලට ගෙන, අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා රු.16,598,600 ක් වැය කර පාපැදි 1000 ක් හා රෝද පුටු 204 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) ටී-ෂර්ට් 16,000 ක් හා හිස්වැසුම් 15,000 ක් මිලදි ගැනීම සඳහා පළමුවර මිල ගණන් කැඳවා තාක්ෂණ ඇගයීම් කමිටුව මඟින් මිලදි ගැනීම සඳහා නිර්දේශ ලබා දී තිබියදීත් කිසිදු පැහැදිලි හේතු දැක්වීමකින් තොරව එම මිල ගණන් ප්‍රතික්ෂේප කර නැවත වරක් මිල ගණන් කැඳවා වෙනත් සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණි. ඒ අනුව,පළමුවර මිල ගණන් පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලැබී තිබූ ආයතනයේ මිල ගණන් හා දෙවන වර මිල ගණ් සැසඳීමේදී රු.2,670,000 ක වැඩිපුර මුදලක් මණ්ඩලයට ගෙවන්නට සිදු වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

